# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / **எனது இல** / **My No** DSD/HO/06/EP/01/චක්‍රලේඛ - 2025

ඔබේ අංකය / **உமது இல** / **Your No** ..........................................

දිනය / **திகதி** / **Date** 2025.07.21

**සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2025/05 ට දෙවන එකතුව.**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි මූලස්ථාන , බැංකු සමිති,ව්‍යාපෘති , ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්,
සියළුම සංවර්ධන නිලධාරින්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්.

**<u>සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2025</u>**

2025 වර්ෂයේදී සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.06.04 දිනැතිව සමෘද්ධි චක්‍රලේඛ 2025/05 හා 2025.07.07 දිනැතිව නිකුත් කරන ලද 2025/05 ට පළමු එකතුව මඟින් ලබා දුන් උපදෙස්වලට අමතරවයි.

02. එම චක්‍රලේඛයේ ඡේද අංක 01 හි iii යටතේ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන සඳහා සෑම සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු වෙතම තම සවිබලගැන්වීමේ ඉලක්කයට අදාලව අවම වශයෙන් තරුණ තරුණියන් 10 දෙනෙකු වත් සම්බන්ධ කිරීමට කටයුතු කරන ලෙස අවධාරණය කරමි.

03. එමෙන්ම චක්‍රලේඛයේ අංක 02 ඡේදය යටතේ රැකියා ඉලක්ක කර ගත් ආධුනික / වෘත්තීන් වල නිරතවන්නන් සඳහා වන වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා සුදුස්සන් වසමේ සමස්ත අස්වැසුම්ලාභී හා තෝරාගත් සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ පවුල් අතරින් තරුණ තරුණියන් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන මඟින් තෝරා ගැනීමෙන් අනතුරුව වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා ආයතන වෙත යොමු කිරිමේදි අවශ්‍ය අවස්ථා වලදි අවබෝධතා ගිවිසුමක් අත්සන් කලයුතුව ඇත. ඒ සඳහා මේ සමඟ ඇති ඇමුණුම් අංක 01 යොදාගත යුතුවේ.

04. මීට අමතරව සුවබොජුන්හල් ස්ථාපනය කිරිමේදී එහි අලෙවි කටයුතු සිදුකරන ව්‍යවසායකයින් සමඟ එළඹිය යුතු ගිවිසුමේ පිටපතක් ද ඇමුණුම් අංක 02 මඟින් මේ සමඟ ඔබ වෙත ලබාදීමට කටයුතු කරමි.

05. එම චක්‍රලේඛයේ ඡේද අංක 03 යටතේ සඳහන් ධාරිතා සංවර්ධන වැඩසටහනට අදාලව පුහුණු වැඩසටහන් සඳහා භාවිතා කල යුතු ව්‍යාපාරික සැලැස්මේ ආකෘතිය ඇමුණුම් අංක 03 මඟින් දක්වා ඇත.

සි.ඩි.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. ලේකම්,ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
05. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |